

# සංක්‍රමණිකයකුගේ සටහන

**කලු ජූලිය**
**1983 - 2008**
**විසිපස් වසරයි**

හෙළා යවුල් සර
තලා දැමූ දින
නුඹේ ගතින් වට
රත් පැහැ රුධිරය
මැකී ගියේ නැත
තවමත් හදවත
රිදවන මතකය

සියලු සත්වයෝ
නිදුක් වෙත්වා
අසල් වැසියාට
කරව ප්‍රේමය

වියරු වෙස් ගත්
කුරිරු මිනිසුන්
මරා දැමූ සඳ
සහෝදරයින්
හඬා වැටුණා
මගේ මව්බිම
දරා ගන්නට
නොහැකි වී දුක

## බණ (ටෝක්ස්) දේශනා

මාස දෙක තුනකට පෙර ඉරිදා දිවයිනේ ඇසි දිසි මානෙන් කාලීන බන හෙවත් ආතල් බණ ගැන කියවලා තිබුනත් හරියටම ඒ ගැන අහන්න ලැබුනේ මෑතකදි දන්න කියන උදව්යත් මාර බන, නියම බන, ආතල් බන කියල කියපු නිසාමයි. උනන්දුව වැඩි උනේ. අපි කවදාවත් ආතල්, මාර බන අහල තිබුනේ නෑනෙ දැන් ඕනෑම කෙනෙකුට බන අහන්න නෙවෙයි බලන්නත් පුළුවන් අන්තර්ජාලේ ඔඔඹඊ් එකට ගොඩ උනහම. එතන තියෙනව නේක ජාති බන සංගත කරලා කට්ටි කඩලා. මාත් බැලුවා ඇත්ත තමයි ඒවා නම් මාර බනම තමයි. දේශකයානෝ හතර අතට අත දිග ඇරල දෙනවා සංස්කෘතික නොදු වා, හැදියාව, සමාජ ගති සිරිත් වලව පරිහානිය ගැන හොඳ උපහැරනත් එක්ක අහන්න ආසයි කිසි කම්මැලි කමක් නැහැ. හිනාත් වෙන්න පුළුවන්. එතුමෝ උපහැරන වලට හොඳ කතා කියලා ශ්‍රාවකයනට රස විඳිල හිනාවෙන්නත් කාලයක් දෙනවා. නාභිය විදීම ගැන කන් විදීම ගැන, බියුටි පාලර් ගැන ඒවට යන වියදම් ගනන් හිලව් ඇතිව කියන හැටි හරි අපුරුයි. අතරින් පතර බුදුන් ගැනත් මතක් කරනවා. ඇත්ත තමයි මේ කියන සේරම ඒත් මේවා කියන කොට තමන් කවුද තමන්ගේ නියෝජනය කුමක්ද. එය කෙසේ විය යුතුද යන්න අමතක වීම තමයි ගැටළුව ඒ නිසා ඒක බන දේශනාවක් නොවී නිකම්ම බන ටෝක එකක් බවට පත් වෙනවා. අපි දන්න විදිහිට නම් බන දේශනයක යම් පිලිවෙතක් තිබිය යුතුය. බනකින් සිදුවිය යුත්තේ ශ්‍රාවකයින් තුල දහම් රසය ඇති කිරීම මිස කුනු ජරා රසය ඇති කිරීම නොවෙයි. මුකරි තම වෙනුවට තිබිය යුත්තේ සන්සුන් හා නිරවුල් පැහැදිලි හඩක්. සාර්ථක බන දේශනා කරන යතිවරයන් හට අවශ්‍ය ඕනෑම උදාහරනයක් බෞද්ධ සාහිත්‍ය තුලින් ලබා ගත හැකියි. ඒකට ගැලරියේ උදාහරන අවශ්‍ය වෙන්නෙ නැහැ. ප්‍රශ්නය මතුවෙන්නෙ එතනදියි. එනම් විෂය දැනුම ලබා ගැනීමයි. ඒ සඳහා බෞද්ධ පොත පත පරිශීලනය කිරීම අවශ්‍ය වෙනවා. මේ සේරටම කාලය අවශ්‍යයි. පහසුම ක්‍රමය නම් තමන් අවට එදිනෙදා අත්විඳින දේ මුකරිකම හරහා ආපසු සමාජයට කරකවා ලබාදීමයි. ඒ ක්‍රමය තමයි ඉක්මනින් ජනප්‍රිය වෙන් තියෙන පහසුම මග. අපි දකින විදියට මේ සේරම ජනප්‍රිය බන කියන කට්ටියට ඉලක්කයක් තියෙනවා. හැබැයි ඒ අජරාමර නිවන් නම් නෙවෙයි. ඒක සමාජය තේරුම් ගන්න අදාල පුද්ගලයා සමාජය කර මතින්ම ඉලක්කයට ගිය පසුයි. එතකොට පමා වෙලා වැඩියි. පන්සල් අසපු බවට පත්වෙලා ශාන්ත බුදු පුතුන් වෙනුවට නළුවන් බවට පත් වුන සාදුලා රූපවාහිනී හා ජනමාධ්‍ය හරහා සමාජ ගතවෙලා අවසන් උන තැන අපි හැමෝටම මතකයි. ඒ කට්ටිය ගෙන් පැවත එන නව පරපුර තමයි මේ බන ටෝක්ස් දෙන්නේ. ගැටළුවක් නැහැ ධර්මයට 2500ක අතීතයක් තියෙනවා. තව 2500ක් ඉදිරියටත් තියේවි. ධර්මයෙන් කියන්නෙත් මේ වගේ දේවල් ගැනනේ. කොහොම උනත් අපේ රටේ තවමත් හදවතට වඩා බුද්ධියෙන් හිතන මිනිස්සු ඉදීම සතුටක්. කාලෙන් කාලෙට රැලි එනවා යනවා . අවසානෙදි මිනිස්සු කුනු රසය ඉවත් කර දහම් රසය ලබා ගන්නවා. ඒක තමයි නියමය. කෙසේ නමුත් ඔබත් වරක් හෝ අසා නරඹන්න මේ ආතල් බන ටෝක්ස් ටික.

## අහන්න ආසයි.....!

"මේ රටේ ඇති වී තිබෙන සියළුම ප්‍රශ්නවලට මූලික හේතුව වන්නේ රටේ පවතින විධායක ජනාධිපති තනතුරයි. 78න් පසු අද දක්වා රටේ ඇති වූ ආර්ථික සමාජ හා දේශපාලන ගැටළුවලට නිසි විසඳුමක් ලබා දීමට නොහැකි වී ඇත්තේ මේ විධායක ක්‍රමයේ ඇති අසීමිත බලතල කේන්ද්‍ර ගතවීම නිසයි. ඒ නිසා වහා ක්‍රියාත්මක වන පරිදි විධායක ජනාධිපති තනතුර හා පාලන ක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තුවට වග කියන නායකයෙකුගෙන් සමන්විත වූ පාලන ක්‍රමයක් කරා අප යොමු විය යුතුය." මේ ප්‍රකාශය කරන්නේ කවුද නොකඩවා වසර 17ක් ඒ ක්‍රමය යටතේ රට පාලනය කල, විරුද්ධ පක්ෂයේ නායිකාවගේ ප්‍රජා අයිතියද අහෝසි කල පන්සල් වටා කටු කම්බි ගසා කොටු කෙරූ විනිසුරුකරුවන්ගේ නිවස් අසල පෙලපාලි ගිය, හෙදියන්ගේ සටන්වලට බෝම්බ ගැසූ, අන්ධයින්ට පවා පහර දුන්, ස්ත්‍රී දූෂකයන්ට සාමදාන විනිසුරුකම් දුන්, විරුද්ධ මතධාරීන් කපා කොටා මරා දමා රැස්වීම් වර්ජන කඩා කප්පල් කරමින් ධාර්මිෂ්ට ව රට පාලනය කල එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක් මන්ත්‍රීවරු. ඉතිහාසයේ පෙර නොවූ පරිදි රාජපක්ෂ ආණ්ඩුවෙන් ඔවුන්ට සැලකිලි ලැබෙමින් පවතිනවා. දැන් කට්ටිය ඇස් ඇරලා ලෝකය දිහා බලන්න අරන්. කෙසේ වෙතත් අවසානයෙදි එතනට යොමුවීම වැදගත් කාරණයක්. ඒත් ඒ සඳහා ප්‍රකාශ, මාධ්‍ය සම්මන්ත්‍රනවලින් එහාට ගිය ප්‍රායෝගික වැඩ පිලිවෙලක් සඳහා යොමු විය යුතුයි. හරියට කරනවානම් සහයෝගය අපෙන්.

## සුරා නිසා F.M. ……

මෙල්බන් ශ්‍රී ලාංකික ජනතාව ආනන්දෙන් ප්‍රඥාව කරා ගෙන යන නවතම ගුවන් විදුලි සේවාව ගැන දැන්වීම ලැබුනේ ගිය සතියේ. ගුවන් විදුලි කරවන ප්‍රධානීන්ගේ නම් වල මුල් අකුරු වලින්ළු සේවාව නම් කරලා තියෙන්නේ. හොයල බලල සවන් දෙන්න. නම් නම් ටිකක් අඃඥ්ඃඥකොරොස් වගේ උනාට ප්‍රශ්නයක් නෑ වැඩ හොඳනම්. ඒ අතින් අපි කොච්චර ලකීද නේ.... රේඩියෝ නම් අපට කීයක්ද ? මේ ගොල්ලො සේරම අපිව දැනුවත් කරන්න පොර... කනවා. අවුල තියෙන්නේ මේ ගොල්ලෝ එකක් හදනවා ඒක කඩනවා. තව එකක් හදනවා, ඒක බෙදනවා. තව අළුත් එකක් හදනවා. අපිත් ඉතින් මේ සේරම අහගෙන ඉන්නවා. අතින් පාඩු කරන් කරන මේ ස්වේච්ඡා සේවේ පව්නේ මේ ගොල්ලෝ....

## ග්ලේන් මැග්‍රාත්....

ඉස්සර පිටියේදී නම් මැග්‍රාත් නියම ව්‍යාඝ්‍රයෙක් වගේ තමයි. පිටියට ආපු වැඩිදෙනෙක් ඔහුගේ ගොදුරු උන හැටි අපට මතකයි. ඒ දවස්වල මැග්‍රාට අපේ කට්ටිය පෙනුනෙත් මංකිලා විදිහට. ඒත් ඒ සේරම පිටියට සීමා උන දේවල්. ඊට පස්සේ ඔහු හොඳ මිනිහෙක් හොඳ හදවතක් තිබුනු මිනිහෙක් බව අද ඔප්පු වෙලා තියෙනවා. සැබෑ ලෙසම අපි අකමැති උනේ ඔහුට නොවේ. ඔහුගේ ක්‍රීඩා කෞෂල්‍යටයි. අපි අද කථා කරන්නේ ඒ මැග්‍රා ගැන නෙවෙයි. දිරිය මිනහෙක් සැබෑ ස්වාමියෙක් හොඳ පියෙක් වූ මැග්‍රා ගැනයි. ඔහුගේ බිරිඳ පසුගියදා ජීවිතයෙන් සමුගත්තා. ඒක සංවේගජනක කාරනයක්. අපි සන්නස වෙනුවෙන් ඔහුට ශෝකය පල කරනවා. ඒ සමගම ඔහුගේ උසස් මානසික ශක්තියටද එසේම ගරු කරනවා. සිය පෞද්ගලික ජීවිතයේ තමන්ගේ බිරිඳගේ අවිනිශ්චිත සෞඛ්‍ය තත්වය ගැන වසර ගනනාවක් තිස්සේ පීඩාවකින් සිටියදීත් තමන්ගේ රට වෙනුවෙන් තමන්ගෙ කොටස නියම ආකාරයෙන් නොසැලී ඉටු කල ආකාරය ප්‍රශංසනීයයි. මානසික කඩා වැටීමකට ලක් නොවී ජීවිතය එලෙස මුහුන දීම පහසු කටයුත්තක් නොවේ. එය අගය කල යුතු කාරනයක්. අපිට අපේ ක්‍රීඩකයින්ට ඔහුගෙන් ගත හැකි ආදර්ශයන් බොහෝයි. අවසන් ලෙස මෙසේ කියනවා. බටහිර ජාතීන්ගේ ජීවිත හා පවුල් සංස්ථාවල ඇති බැඳීම් ගැන අළුතින් හිතන්න මෙය හොඳ ප්‍රවේශයක් වේවි අපි බොහෝ දෙනෙකුට.

සංක්‍රමණිකයා

## මානවඩුගේ මාසය





**VCE**

**ENGLISH CHEMISTRY MATHS**
ACCOUNTS & ECCONOMICS

ENGLISH AND MATHS
FOR YEAR 7 TO YEAR 10

PROFESSIONAL GROUP CLASS TUTORING
IN CLAYTON
**EXPERINCED AND QUALIFIED TUTORS**

**CONTACT : 03 9545 5531**
**:04 2275 9718**